## ශ්‍රී ලංකා
## ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## පාර්ලිමේන්තුව

---

# 1998 අංක 37 දරන ශ්‍රී ලංකා බ්‍රහ්ම කුමාරි රාජයෝග මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 1998 ජුනි මස 22 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 ජුනි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් **පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 4.50 යි.** තැපැල් ගාස්තුව : රු. **2.50 යි.**

**1998 අංක 37 දරන ශ්‍රී ලංකා බ්‍රහ්ම කුමාරි රාජයෝග මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1998 ජුනි මස 22 වන දින]

එල්. ඩී.–ඕ. 60/96.

**ශ්‍රී ලංකා බ්‍රහ්ම කුමාරි රාජයෝග මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"ශ්‍රී ලංකා බ්‍රහ්ම කුමාරි රාජයෝග මධ්‍යස්ථානය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන මධ්‍යස්ථානයක් එකී මධ්‍යස්ථානයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීති අනුව එකී මධ්‍යස්ථානයට අදාළ සියලු පරමාර්ථ සහ කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටුකර ගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී මධ්‍යස්ථානය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු එකී මධ්‍යස්ථානය විසින් මේ දක්වා සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1998 අංක 37 දරන ශ්‍රී ලංකා බ්‍රහ්ම කුමාරි රාජයෝග මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා බ්‍රහ්ම කුමාරි රාජයෝග මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මක වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "මධ්‍යස්ථානය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා බ්‍රහ්ම කුමාරි රාජයෝග මධ්‍යස්ථානයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කෙරෙන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා බ්‍රහ්ම කුමාරි රාජයෝග මධ්‍යස්ථානය" යන නාමය සහ අභිධානය යටතේ අඛණ්ඩ පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ හා සංස්ථාවේ අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය. තව ද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය.

2—D 039879—5,900 (97/02)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) අධ්‍යාත්මික විඥානය පැවරුවා ලීම, සහ රාජයෝග භාවනා පුහුණු කිරීම ;

(ආ) චිත්ත සමාධිය ලබා ගැනීමට අපේක්ෂා කරන සියලු තැනැත්තන්ට රාජයෝග භාවනාව ප්‍රගුණ කිරීම මගින් ආධාර කිරීම ;

(ඇ) සියළු තැනැත්තන් විෂයයෙහි දයාව හා ගෞරවය මත පදනම් වූ සමාජයක් ඇති කිරීම ;

(ඈ) සංස්ථාවේ ඉහත කී පරමාර්ථ ප්‍රවර්ධනය කරන්නා වූ සියලු කාර්ය භාරගෙන ක්‍රියාත්මක කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය සේවක පිරිස් සේවයට බඳවා ගැනීමේ, නියුක්ත කරගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ ද කරුණු ඉටු කිරීමේ ද, දේවල් ක්‍රියාවේ යෙදවීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ නිලධරයන්ගෙන් සහ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන වෙනත් යම් තැනැත්තන්ගෙන් සමන්විත වූ කළමනාකරණ මණ්ඩලයක් විසින්, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ මධ්‍යස්ථානයේ ධුර දැරූ කළමනාකරණ මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය වන්නේ ය.

6. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, අස්වීම හෝ අස් කිරීම සඳහා ද සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලයේ, නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ හා සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම සඳහා ද කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සඳහා ද කළමනාකරණ මණ්ඩලයේ කටයුතු කරගෙන යාමේ කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද සංස්ථාව විසින් කලින් කල මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. සංස්ථාවේ රීති.

(2) සංස්ථාවේ තත්කාලයේ බල පවත්නා හෝ මින් පසු සම්මත කරනු ලබන හෝ කිසිම රීතියක් සංස්ථාවේ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මිස වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම නොකරනු ලැබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී මධ්‍යස්ථානයේ බල පැවැත් වූ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ පනත යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලු සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තාහ.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවත්නා වූ මධ්‍යස්ථානයේ සියලු ම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර; එදිනට මධ්‍යස්ථානයට අයවිය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් සහ සාමාජික මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය. මධ්‍යස්ථානය විසින් ගෙවිය යුතු සහ මධ්‍යස්ථානයට අයවිය යුතු ණය.

8. මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව වෙත පැවරෙන යම් නිශ්චල හෝ චංචල දේපළක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එවැනි සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

රීතිවලට යටත් ව, ඒ දේපළ උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව, සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේද යනවග.

9. සභාපතිවරයා එක් අයකු වශයෙන් ඇතුළත් සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තුන්දෙනකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු ය. ඒ සාමාජිකයන් විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තවද එසේ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනට පරිබාහිරව විය යුතු ය.

සංස්ථාවේ මුදල් යෙදවීම.

10. කවර හෝ ප්‍රභවයකින් ලැබුනේ වුව ද සංස්ථාවේ මුදල් හා දේපළ මෙහි සඳහන් පරිදි වූ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා පමණක් ම යොදා ගත යුතු වන අතර, ලාභාංශ, ප්‍රසාද මුදල් හෝ කවර හෝ ලාභ වශයෙන් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් එහි සාමාජිකයන්ට ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

12. මේ පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.